# ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය


## මධු වර්ණකුලසූරිය

සොලිස්ටර් සහ බැරිස්ටර්
ඕස්ට්‍රේලියාව
නීතීඥ - ශ්‍රී ලංකාව


මෑත කාලීනව ශ්‍රී ලංකා රජය දන්වා සිටියේ ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසි වැඩසටහන තාවකාලිකව නවත්වා ඇති බවයි. මෙයට හේතුව කුමක්ද යන්න රජය විසින් දන්වා සිටියේ නැත. මේ වන තෙක් ශ්‍රී ලාංකික පුරවැසියන් 3500 කට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන තිබුණි. මේ වන විට ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම්පත් 750 ක් පමණ ශ්‍රී ලංකා රජයට ලැබී ඇති අතර, ඒවා සඳහා ද්විත්ව පුරවැසිභාවය බලා දීම මේ වන විට අක්‍රිය ව ඇත.




ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තුව පවසා සිටින්නේ පවතින ද්විත්ව පුරවැසිභාවයේ වැඩ සටහන මගින් රටට කිසිදු ප්‍රයෝජණයක් අත් නොවන බවයි. සමහර අවස්ථාවලදී පුද්ගලයන් ඉහල බදු ගෙවීම කපා හැර ලාංකික දේපල මිලට ගැනීම සඳහා පමණක් වන අරමුණින් ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන බව එම දෙපාර්තමේන්තුව පවසයි.

අක්‍රිය කොට ඇති වැඩසටහන අනුව, යම් පුද්ගලයෙකු ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම් කිරීමේදී, විශ්ව විද්‍යාල උපාධිධාරී සුදුසුකම හෝ අවුරුදු 2 (දෙක) ක වත් ඩිප්ලෝමා සහතික ලාභියෙකු විය යුතුය. එසේම රුපියල් මිලියන 2.5 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අවම වසරක කාලයක් පිළිගත් බැංකුවක තැන්පත් කර තිබිය යුතුය. මෙයට ව්‍යතිරේඛව, මිලියන 2.5 ක් වටිනා ශ්‍රී ලාංකික දේපලක් ඉදිරිපත් කල හැකිය. එසේම අනේවාසික විදේශ විනිමය ගිණුම් හිමියන්ට (NRFC) ඔවුන්ගේ ගිණුමේ ඇමරිකානු ඩොලර් 25000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇත්නම්, ඔවුහුද ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබති.

තවද, ප්‍රාප්තිය හෝ සමාජ තත්ත්වය අනුවද ද්විත්ව පුරවැසිභාවය ප්‍රධාන කෙරේ. ප්‍රධාන අයදුම්කරු රුපියල් 200,000/-ක් මේ සඳහා ගෙවිය යුතු වූ අතර, දරුවන්ට සහ වල්ලභයාට රුපියල් 50,000/- බැගින් ගෙවිය යුතු විය.

නමුත් යෝජිත නව වැඩසටහන අනුව, ද්විත්ව පුරවැසිභාවය අයදුම් කරන්නන්, රටේ ආර්ථිකය සඳහා දායක වන අන්දම පිළිබඳව සොයා බැලීමක් සිදු කරයි. මෙහි මූලික අරමුණ නම්, වංචා සිදු කිරීමකින් තොරව රටේ පුරවැසිභාවයට පත් වීමයි. දැනට ද්විත්ව පුරවැසිභාවය ලබා සටින විදේශිකයන්ද ඔවුන්ගේ තත්ත්වය නැවත රජයට අනාවරණය කිරීමට යෝජිතය. ඇතැම්විට ඔවුන්ට සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට සිදුවෙතැයි කියනු ලැබේ.

කෙසේ වෙතත් වැඩිමහළු පුරවැසියන්ට සහ උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති පුරවැසියන්ට පහසුවෙන් ද්විත්ව පුරවැසිභාවය අයදුම් කිරීමට අවකාශ සලසන බවට යෝජිත සැලැස්ම අනාවරණය කරයි.

## “ද්විත්ව පුරවැසිභාවය” යනු කුමක්ද?

ඔබගේ වැඩිදුර දැනගැනීම සඳහා “ද්විත්ව පුරවැසිභාවය” යනු කුමක්ද යන්න සලකා බලමු.

යම් ශ්‍රී ලාංකික පුරවැසියෙකු වෙනත් රටක පුරවැසිභාවය ලබා ගත් සැනින්ම, ඔහු හෝ ඇයගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය නිතැතින්ම අහෝසි වේ. කෙසේ නමුත් මෙසේ අහෝසි වීමට පෙර හෝ පසුව ඔහුට හෝ ඇයට ශ්‍රී ලාංකික පුරවැසිභාවය සඳහා අයදුම් කළ හැකිය. වෙනත් රටක පුරවැසිභාවය ලබා ගැනීමට පෙර අයදුම් කරන්නේ නම්, “පුරවැසිභාවය රඳවා ගැනීම” සඳහා අයදුම් කිරීමක් වන අතර, වෙනත් රටක පුරවැසිභාවය ලබා ගත් පසු අයදුම් කරන්නේ නම්, එය “පුරවැසිභාවය යලි ඇරඹුමක්” සඳහා අයදුම් කිරීමක් වේ. මෙසේ ශ්‍රී ලාංකික පුරවැසිභාවයට වෙනත් රටක පුරවැසිභාවය ලබාගැනීමට පෙර හෝ පසුව අයදුම් කර ලබා ගත් පසුව, ඔහුට හෝ ඇයට “ද්විත්ව පුරවැසිභාවය” ලැබේ.

වර්තමානයේ අක්‍රියව පවතින ද්විත්ව පුරවැසිභාවයේ වැඩසටහන යටතේ පහත සඳහන් කාණ්ඩවල පුද්ගලයන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වීම

1 වෘත්තිමය පුද්ගලයන්
2 වැඩිමහළු පුද්ගලයන්
3 සරු ආදායම් ලාභීන්
4 අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම්හිමියන්
5 භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජකයන්

## ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීමට අයදුම් කළ හැකි රටවල්

1 ඕස්ට්‍රේලියාව
2 නවසීලන්තය
3 එක්සත් රාජධානිය
4 ප්‍රංශය
5 ස්විස්ටර්ලන්තය
6 ඉතාලිය
7 ඇමරිකා එක්සත් ජනපදය
8 කැනඩාව

## ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම් කිරීමේදී ඔබ ඉදිරිපත් කලයුතු ලේඛණ මොනවාද ?

1 අයදුම්කරුගේ උප්පැන්න සහතිකය
2 අයදුම්කරුගේ විවාහ සහතිකය
3 විදේශීය පුරවැසි සහතිකය
4 ගුවන් ගමන් බලපත්‍ර ආදිය

මීට අමතරව යම් උපලේඛණ ඔබෙන් ඉල්ලුම් කලහොත් ඔබ විසින් ඒවා ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.

## මේ සඳහා අවශ්‍ය අයදුම්පත්‍රය ඔබ ලබාගත යුත්තේ කොහෙන්ද ?

http://www.immigration.gov.lk යන වෙබ් අඩවියෙන් ඔබට අයදුම් පත්‍රය ලබා ගත හැකිය.

## ඔබ අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුත්තේ කොතැනටද ?

පාලන නිළධාරී
ආගමන විගමන දෙපාර්තමේන්තුව
පුරවැසි අංශය
නො. 41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10

## රේරුකානේ චන්දවිමල මහ නා හිමියන් වෙනුවෙන් වෙබ් අඩවියක්




රේරුකානේ චන්දවිමල මහ නා හිමියන් විසින් රචනා කරන ලද වටිනා ධර්ම පුස්තක ලබා ගන්නටත් බුදු දහම හා සබැඳුණ තවත් කරුණු රැසකින් දැනුම්වත් වන්නටත් අවස්ථාව ලබා දෙන වටිනා වෙබ් අඩවියකි http://www.rerukanemahanahimi.lk/

හැකි විටෙක මේ අඩවියට පවිසෙන්නට ඔබට හැකි නම් එය ඔබටත් ඔබේ හිතවතුනටත් ලැබෙන අනගි අවස්ථාවක් වනු ඇත


## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහසයභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com



## TUTORING -$20 p/h

Group and Individual classes by an experienced lady teacher (Former teacher in srilanka) with BSc. and MSc. Qualified.

- Chemistry, Biology and Physics for all grades (Including VCE)
- Science and Maths for grade 6,7, 8, 9, 10, 11

Time and locations are flexible. Ability to arrange flexible times for individual classes. (Consider home visits also)

Individual attention for all students.
Provide Support with school homework.
Special attention and extra hours for weak students.
Help with practical sessions.
Covers 10 years past papers.
Supply printed notes and work sheets.
Results are guaranteed.

Contact - 0424475891, 0451417502